Business & Accounting Studies Business & Accounting Studies Business & Accounting Studies

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

60 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2010 ජුලි
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2010

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I , II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) **1** සිට **40** තෙක් ප්‍රශ්න වල දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරු වලින් **නිවරුදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.
(v) I හා II පිළිතුරු පත්‍ර එක් පත්‍රයක් වන සේ එකට අමුණා භාර දෙන්න.

---

01. ව්‍යාපාර කටයුතු වලට බලපෑම් අති කරන ජිවන වියදම, සේවා නියුක්ති මට්ටම, ජාතික ආදායම, උද්ධමනය ආදි සාධක ක්‍රියාත්මක වන ව්‍යාපාරික පරිසරය වන්නේ,
   1. සමාජ හා සංස්කෘතික පරිසරයයි.
   2. තාක්‍ෂණික පරිසරය යි.
   3. නෛතික පරිසරය යි.
   4. ආර්ථික පරිසරය යි.

02. පෙරළුම් කර්මාන්තයට අයත් වන්නේ,
   1. මෝටර් රථ තැනීම
   2. නිවසක් තැනීම.
   3. මැටි වලින් ගඩොල් සෑදීම.
   4. මේසයක් සෑදීම.

03. බාහිර ව්‍යාපාර පරිසරයට බලපාන සාධකයක් නොවන පිළිතුර වන්නේ මින් කුමක්ද?
   1. පොලි මට්ටම, ජිවන වියදම, කළමණාකරුවන්
   2. ගොඩනැගිලි, භූගෝලිය පරිසරය, අයිතිකරුවන්
   3. ගනුදෙනුකරුවන්, කළමණාකරුවන්, මුදල්
   4. ස්වාභාවික සිද්ධීන්, තරගකාරීත්වය, පාරිභෝගික රටා.

04. තොරතුරු තාක්‍ෂණය මාධ්‍යයක් වනුයේ,
   1. සාමාන්‍ය තැපල් ක්‍රමය වෙනුවට ඉලෙක්ට්‍රොනික තැපල් ක්‍රමය (e-mail) භාවිතයට ගැනීම.
   2. අන්තර් ජාතික වෙළෙඳ පොළ විවෘත වීම මගින් දේශිය වෙළෙඳ පොළ අරාධීන වීම.
   3. ATM කාඩ්පත් භාවිතයෙන් ඉවත් වීම.
   4. අන්තර්ජාලය භාවිතයට පැමිණීමත් එම නිසා නිෂ්පාදන කාර්යයන් උදාසින වීමත් ය.

05. ව්‍යාපාර ආයතනයක් තම අනාගත සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී සැලකිලිමත් වන කරුණක් වන්නේ (W5 අනුකූලව)
   1. අයවැය වාර්තා සකස් කිරීම
   2. සුදුසු ස්ථානයක් තිරණය කිරීම
   3. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිල්ලට ගැනීම.
   4. කොතරම් කාලයකින් අරමුණු ලගා කර ගන්නේ ද?

06. අළෙවි සැලැස්මක් පිළියල කිරීම ව්‍යාපාර සාර්ථකත්වයට ප්‍රබල හේතුවක් වනු ඇත. අළෙවි සැලැස්මක අඩංගු නොවිය යුතු කරුණක් වන්නේ,
   1. මාස ගණන (සැලැස්ම ක්‍රියාත්මක) වර්ෂ හෝ විය හැක.
   2. භාණ්ඩ හෝ සේවා පිළිබඳ විස්තර
   3. ඇස්තමේන්තු ගත වියදම හා ලාභය
   4. ඉහත සියල්ලම.

07. පහත සදහන් රේඛණ අතුරෙන් චෙක්පතේ අයිතිය පැවරීම සීමා කර ඇත්තේ පහත සදහන් කිනම් අවස්ථාවේ ද?
   1. ආදායකයාගේ ගිණුමට පමණයි
   2. මහජන බැංකුව
   3. ගනුදෙනු කළ නොහැක
   4. රු. 20,000 ක් පමණි.

දෙවන පිටුව බලන්න

08. මට සුමිත්ගෙන් චෙක්පතක් ලැබුණි. පසුව එය නැති වු අතර ආපසු සොයාගත නොහැකි විය. මා විසින් පළමුව කළ යුත්තේ,
1. ගෙවීම් නතර කරන ලෙස බැංකුව දැනුවත් කිරීම ය.
2. චෙක්පත් සොයා ගන්නා තුරු සිටීම.
3. සුමිත්ට ඔහුගේ බැංකුවෙන් ගෙවීම් නතර කරන ලෙස බැංකුව දැනුවත් කරන්නැයි ඉල්ලා සිටීම.
4. සුමිත්ගෙන් තවත් චෙක්පතක් ඉල්ලා සිටීම.

09. 2007 අංක 07 දරණ සමාගම් පනත නිසා අක්‍රිය වු ව්‍යාපාර සංවිධානය වන්නේ,
1. ඇපයෙන් සීමිත සමාගම්
2. පෞද්ගලික සමාගම්
3. ජනතා සමාගම්
4. පොදු සමාගම්

10. වාණිජ බැංකුවක් අනෙකුත් බැංකු වලින් වෙන් කර හඳුනා ගත හැකි විශේෂ ලක්ෂණය වන්නේ,
1. ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාම.
2. අනේවාසික හා නිර්නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යාම
3. ජංගම ගිණුම් පවත්වාගෙන යාම
4. කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ණය පහසුකම් ලබා දීම.

11. ව්‍යාපාර ආයතනයක් ලියාපදිංචි කිරීම මගින් ව්‍යාපාර ආයතනයකට ලබා ගත හැකි ප්‍රතිලාභ වන්නේ,
1. පිළිගැනීමක් ඇති වීම
2. නීතිමය රැකවරණයක් ලැබීම.
3. ණය ලබා ගැනීම
4. ඉහත සියල්ලම.

12. එකතු කළ අගය මත බදු (VAT) අය කරනු ලබන්නේ,
1. රේගු දෙපාර්තමේන්තුව
2. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
3. පළාත් සභාව
4. ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව

13. තෙවන පක්ෂ රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන ඇති මෝටර් රථයක් තාප්පයක හැපී, තාප්පය, මෝටර් රථය, රියදුරා යන තිදෙනාට ම බරපතල හානි සිදු විය. එහි දී වන්දි ලබා ගැනීමට හැකි වන්නේ,
1. රියදුරාට පමණි.
2. තාප්පය හා වාහනයට පමණි.
3. වාහනයට පමණි.
4. තාප්පයට පමණි.

14. ඉන්දිකා පෙරේරා මහත්මිය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ ගණකාධිකාරිවරියයි. ඇය විමල් මහතාට (සහය ගණකාධිකාරි) ආයතනයේ ජංගම ගිණුමක් රු. 1,000,000 (ලංකා බැංකුවේ) චෙක්පතක් නිකුත් කර ව්‍යාපාරයේ ණයහිමියන් වන බණ්ඩා සමාගමේ වාණිජ බැංකුව වන කොමර්ෂල් බැංකුවට හා කුසුමා සමාගමේ වාණිජ බැංකුව වන සම්පත් බැංකුවේ ගිණුම් වල තැන්පත් කිරීම මගින් ණය පියවීමට බලාපොරොත්තු වෙයි. මෙහි අණලදු කවරුහුද?
1. සීමිත කුසුමා සමාගමේ වාණිජ බැංකුව හා සීමිත බණ්ඩා සමාගමේ වාණිජ බැංකුව
2. සහය ගණකාධිකාරි විමල් රත්නායක මහතා.
3. ලංකා බැංකුව
4. ඉහත කිසිවකු නොවන අතර අණලදු පිළිබඳ උපකල්පනය කිරීමට ප්‍රමාණවත් දත්ත සපයා නොමැත.

15. දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් ලිපි හා පාර්සල් යැවීමට සංවිධානය වී ඇති සේවාව වන්නේ,
1. ඉන්ටර්කොම් සේවාව. 2. කුරියර් සේවය 3. දුරකථන සේවය 4. ෆැක්ස් සේවය

16. සන්නිවේදන ක්‍රියාවලියට ඇතුළත් නොවන්නේ,
1. ග්‍රාහක යා 2. ප්‍රතිචාරය. 3. පැහැදිලි බව. 4. යවන්නා.

17. ව්‍යාපාරයක ලාභය උපරිම කර ගැනීමේ දී අඩු පිරිවැයක් යටතේ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම වැදගත් වේ. ගබඩා කිරීම යනුවෙන් හැඳින්වෙන්නේ,
1. අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියට හෝ පරිභෝජන ක්‍රියාවලියට ගන්නා තෙක් රැස්කර තබා ගැනීමයි.
2. භාවිතයට ගත නොහැකි භාණ්ඩ සැපයුම්කරුවන්ට ආපසු යවන තෙක් රැස්කර තබා ගැනීමයි.
3. ඍජු ද්‍රව්‍ය හා වක්‍ර ද්‍රව්‍ය පිරිවැය ගණනය කරන තෙක් රැස්කර තබා ගැනීමයි.
4. ඉහත කිසිවක් නොවේ.

18. අනේවාසික විදේශ මුදල් ගිණුමක් *(NRFC)* විවෘත කල හැක්කේ,
1. දැනට විදේශ රැකියාවක නිරත හෝ කලින් නිරතව සිටි ශ්‍රී ලාංකික පුරවැසියන්ට
2. විදේශ පුරවැසිභාවය ලබා ගැනීමට පෙර ශ්‍රී ලාංකික පුරවැසියෙකු වු විදේශ පුරවැසියෙකුට.
3. ශ්‍රී ලංකාවේ ස්ථාපිත විදේශ රැකියා නියෝජිත ආයතනයකට
4. අවම මූලික තැන්පතුව ඇමරිකන් ඩොලර් 500 ක් සහිත ඕනෑම අයෙකුට.

19. පහත සඳහන් ඒවායින් නිර්මාණක කර්මාන්තය තෝරන්න.
1. කඩදාසි කර්මාන්තය 2. ධීවර කර්මාන්තය 3. ලුණු කර්මාන්තය 4. මැණික් කර්මාන්තය

20. රාජ්‍ය ස්කාගර සංස්ථාව පෞද්ගලික අංශයට විකිණීමෙන් පසුව එම ආයතනයේ අතිරික්ත මුදල් ආයෝජනය කොට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජයෙන් මිලට ගන්නා ලදි. අනතුරුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අතිරික්ත මුදල් භාවිත කර ඉන්දියානු සංගමයක් යටතේ පැවති ඇපලෝ රෝහල මිලදී ගන්නා ලදි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අධිකරණ නියෝගයක් මත පසුගිය වසරේදී නැවත රජයට පවරා ගන්නා ලදි. ඉහත කාරණා පදනම් කරගෙන ඇපලෝ රෝහලේ අයිතිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

01. රාජ්‍ය ස්කාගාර සංස්ථාව  02. රජය
03. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව  04. ඉන්දියානු සමාගම

21. ගනුදෙනු සටහන් කිරීමේ මූලික අරමුණ වන්නේ,
1. සම්පත් පාලනයට අවශ්‍ය මූලික තොරතුරු ලබා දීම
2. ලාභාලාභ ගණනය කිරීමට අවශ්‍ය මූලික තොරතුරු ලබා දීම
3. ආදායම් වියදම් ප්‍රමාණය දැන ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.
4. සම්පත් අසීමිත නිසා අවශ්‍ය මූලික තොරතුරු ලබා ගැනීමට ය.

22. පහත සමීකරණ වලින් නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.
1. වත්කම් + බැංකු ණය = ප්‍රාග්ධනය + වගකීම්
2. ජංගම නොවන වත්කම් + ජංගම නොවන වගකීම් = ප්‍රාග්ධනය + ජංගම වත්කම් + ජංගම වගකීම්
3. ජංගම නොවන වත්කම් + ජංගම වත්කම් = ප්‍රාග්ධනය - අතිරේක ප්‍රාග්ධනය + ජංගම වගකීම්
4. වත්කම් + වියදම් = ප්‍රාග්ධනය + ආදායම් + වගකීම්

23. ව්‍යාපාරයේ වියදම් වල වැඩි වීමක් සිදුවන්නේ කුමන ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස ද?
1. පරිගණකයක් මිලදී ගැනීම.  2. ණයහිමියෙකුට ගෙවීම.
3. වැටුප් ගෙවීම.  4. බැංකු ණයක් නැවත ගෙවීම.

24. කිසියම් ණය ගැති ශේෂයක් එම වටිනාකමේ ම ණයහිමි ශේෂයට එරෙහිව කපා හැරීමේ දී ශුද්ධ ජංගම වත්කම් වලට වන බලපෑම වන්නේ,
1. වැඩි වීමකි.  2. අඩු වීමකි.  3. වෙනසක් නොවේ.  4. ඉහත කිසිවක් නොවේ.

25. සීනි අළෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යන එක්තරා ව්‍යාපාරිකයෙක් කිලෝව රු. 90 ක් බැගින් සීනි කිලෝ 2000 ක් මිලදී ගෙන ඇති අතර, මිලදී ගනිමේ දී වෙළෙඳ වට්ටමක් ලෙස 10% ලබා ගෙන ඇත. සියළු ම ගැණුම් ණය පදනම මත වන අතර ණයහිමියන්ට රු. 200,000 ගෙවා ඇත. මෙම ව්‍යාපාරයේ පසුගිය මස ගැණුම් කොපමණද ?
1. රු. 180,000  2. රු. 198,000  3. රු. 162,000  4. රු. 200,000

❖ 26 සිට 31 දක්වා පහත සිද්ධි පාදක කොට ගෙන පිළිතුරු සපයන්න.

සිරිපාල මහතා කේවල ස්වාමි ව්‍යාපාරයක් තම රු. 1,000,000 ප්‍රාග්ධනය යොදා ආරම්භ කරයි. ඔහු එම ව්‍යාපාරයෙන් රු. 200,000 බැංකු ගිණුමක් ද ඔහුගේ පෞද්ගලික ඉඩමක් (රු. 300,000) ව්‍යාපාරයට යොදවයි. ඔහු ව්‍යාපාරයේ පිරිවැය සැකසීම සඳහා රුක්ෂානි මහත්මිය ව පිරිවැය ගණකාධිකාරි ලෙස බඳවා ගන්නා අතර ඇයගේ මාසික වැටුප රු. 10,000ක් ගෙවීමට පොරොන්දු විය. පහත පිරිවැය තොරතුරු රුක්ෂානි මහත්මිය ඉදිරිපත් කරන ලදි.

| | | | |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | 40,000 | වක්‍ර ද්‍රව්‍ය | 24,000 |
| සෘජු ශ්‍රමය | 35,000 | වක්‍ර ශ්‍රමය | 15,000 |
| සෘජු වෙනත් | 22,000 | වක්‍ර වෙනත් | 11,000 |

නිෂ්පාදන ඒකක ගණන 1,000

26. ඒකක පිරිවැය,
1. රු. 144  2. රු. 133  3. රු. 147  4. රු. 152

27. ප්‍රාථමික පිරිවැය,
1. රු. 92,000  2. රු. 87,000  3. 86,000  4. රු. 97,000

28. පොදු කාර්ය පිරිවැය
1. 20,000  2. 30,000  3. 40,000  4. රු. 50,000

29. මුලු නිෂ්පාදන පිරිවැය
1. රු. 140,000  2. රු. 150,000  3. 147,000  4. රු. 137,000

හතරවන පිටුව බලන්න

30. සිරිපාල මහතා විසින් සපයා ඇති මුලු වත්කම් ප්‍රමාණය
1. රු. 1000,000 2. රු. 1,200,000 3. රු. 1,450,000 4. රු. 1,500,000

31. ශේෂ පිරික්සුමකින් හෙළිදරව් වන වරදක් වන්නේ,
1. මුලධර්ම දෝෂ 2. ඌනතා දෝෂ 3. හිලව් දෝෂ 4. ද්විකරණ දෝෂ

32. බැංකු ප්‍රකාශණයේ වාසිදායක ශේෂයක් පෙන්වීමටත් මුදල් පොතේ (බැංකු තීරුවේ) අයිරාවක් පෙන්වීමටත් හේතුව විය හැක්කේ,
1. නිෂ්කාශණය නොවු චෙක්පත්
2. ගෙවීමට ඉදිරිපත් නොවු චෙක්පත්
3. මුදල් පොතේ සටහන් නොවු ස්ථාවර නියෝග මත කරන ලද ගෙවීම්
4. මුදල් පොතේ සටහන් වී නොමැති බැංකු ගාස්තු.

33. පහත දැක්වෙන්නේ රවී සමාගමේ පොත් තබන්නා විසින් 2010.03.31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් විස්තරයයි.

බැංකු සැසඳුම් විස්තරය

| | | |
|---|---|---|
| මුදල් පොතට අනුව බැංකු ශේෂය | | 278,530 |
| එකතු කලා :- ගෙවීමට ඉදිරිපත් නොවු චෙක් | 42,800 | 42,800 |
| | | 321,330 |
| අඩු කලා :- ස්ථාවර නියෝග - රක්‍ෂණ වාරිකය | 2730 | |
| නිෂ්කාශණය නොවු චෙක්පත් | 28,420 | (31,150) |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | 290,180 |

රවී සමාගමේ 31.03.2010 දිනට ශේෂ පත්‍රයේ දැක්විය යුතු නිවැරදි බැංකු ශේෂය වන්නේ,
1. රු. 278,530 2. රු. 290,180 3. රු. 275,800 4. රු. 292,910

34. ආපසු යැවුම් ජ'නලයේ ගනුදෙනු සටහන් කිරීමට යොදා ගනු ලබන මූලික ලියවිල්ල වන්නේ,
1. හර පත 2. බැරපත 3. ගෙවීම් වවුචරය 4. ඉන්වොයිසිය

35. සුලු මුදල් භාරකරුවෙකු සිටිමෙන් ව්‍යාපාරයකට ඇති වාසියක් නොවන්නේ,
1. ගිණුම් තැබීමේ කටයුතු තරමක් දුරට පහසු වීම.
2. සුලු වියදම් කපා හල හැකිවිම.
3. ප්‍රධාන මුදල් භාරකරුගේ කටයුතු සිදුකිරිමට අපහසු වීම.
4. ප්‍රධාන මුදල් භාරකරුගේ කටයුතු කාර්යක්‍ෂම වීම.

36. සෑම ව්‍යාපාරයකම ගනුදෙනු සටහන්කිරීමේ දී අතපසු වීම් සිදුවිය හැක. ශේෂ පිරික්සුම මගින් ව්‍යාපාර ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදුවු වැරදි අණාවරණය කරගත හැක. නමුත් එසේ නොවන අවස්ථා ද ඇත. එවැනි අවස්ථාවකට උදාහරණයක් නොවන්නේ,
1. ණයට ගැනුම්, ගැනුම් ගිණුමේ බැර පැත්තේ ද ණයහිමි ගිණුමේ හරටද සටහන් කිරීම.
2. ස්ථාවර වත්කම් මිලදී ගැනිම, වත්කම් වෙළෙද පොල අගයට වඩා අඩු අගයකින් සටහන් කිරීම.
3. ගැනිලි, ගැනිලි ගිණුමේ දෙවරක් හර කර මුදල් සහ භාණ්ඩ ගිනුම බැර කිරීම
4. අත්පිට මුදලට භාණ්ඩ ගැනිම, මුදල් ගිණුම පමණක් බැර කර තිබිම.

37. නිමල් පෙරේරාගෙන් ලැබිය යුතු රු. 10,000 ක් ලබා ගැනිමේ දී රු. 1,000 ක් අඩු කර ඉතිරිය පමණක් ලබා ගැනිමට ව්‍යාපාරය එකඟවුනි නම් එම අඩු කළ මුදල,
1. වෙළෙද වට්ටම කි. 2. මුදල් වට්ටම කි. 3. දුන් වට්ටම කි. 4. ලද වට්ටම කි.

38. ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. ද්විත්ව සටහන් වල නිවරදිතාවය තහවුරු කර ගැනිම යි.
2. ගණිතමය නිවරදිතාවය තහවුරු කර ගැනිම යි.
3. ලාභාලාභ තහවුරු කර ගැනිම යි.
4. වත්කම් හා වගකිම් වල අගය තහවුරු කර ගැනිම යි.

39. සුලු මුදල් භාරකරුවෙකුට දුන් අග්‍රිමය රු. 1,500 කි. මාසයේ වියදම රු. 1,110 කි. ප්‍රතිපුරණය කළ යුතු මුදල වන්නේ,
1. රු. 1,500 කි. 2. රු. 390 කි. 3. රු. 1,110 කි. 4. රු. 2,610 කි.

40. ගොඩනැගිලි අලුත් වැඩියා සඳහා වැය වු රු. 10,000 ගොඩනැගිලි ගිණුම හර කර, මුදල් ගිණුම බැර කර ඇත. මෙම වැරදි ද්විත්ව සටහන හදුන්වන්නේ,
1. ඌනතා දෝෂය කි. 2. හිලව් දෝෂයකි. 3. මුලධර්ම දෝෂය කි 4. අතිරික්තතා දෝෂය කි.